# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

## පුවත්පත් නිවේදනය

### 2020 පෙබරවාරි මාසයේදී පැවැත්වීමට නියමිත ඉංජිනේරු උපාධිය සඳහා වූ අභියෝග්‍යතා පරීක්ෂණය (GATE) සඳහා 2019 සැප්තැම්බර් 24 වන දින දක්වා අයදුම්පත් භාර ගැනේ

ඉන්දියානු රජයේ මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් මේ වසරේ ඉංජිනේරු උපාධිය සඳහා වූ අභියෝග්‍යතා පරීක්ෂණය (GATE) දිල්ලියේ ඉන්දියානු තාක්ෂණ ආයතනය (IIT) විසින් සංවිධානය කර ඇත. IITs / IISc / NITs සහ අනෙකුත් ප්‍රමුඛ පෙළේ ඉන්දියානු විශ්ව විද්‍යාල විසින් පිරිනමනු ලබන ඉංජිනේරු හා විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අපේක්ෂා කරන අපේක්ෂකයින් GATE පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ඉන්දියාව පුරා හා කොළඹ ඇතුළු විදේශ රටවල තිබෙන මධ්‍යස්ථාන 700 කට අධික සංඛ්‍යාවකදී මිලියනයකට අධික අපේක්ෂකයින් සංඛ්‍යාවක් මෙම වසරේදී මෙම විභාගයට පෙනී සිටිනු ඇත. 2020 ජුනි - ජූලි ඇරඹෙන ඊළඟ අධ්‍යයන වර්ෂයට ඇතුළත් කර ගැනීම සඳහා මෙම විභාගය 2020 පෙබරවාරි 1, 2, 8, 9 යන දිනවල පැවැත්වීමට නියමිතය. අයදුම් කිරීමට බලාපොරොත්තු වෙන

අපේක්ෂකයින්ට 2019 සැප්තැම්බර් 24 හෝ ඊට පෙර අන්තර්ජාලය හරහා ඉල්ලුම් කළ හැකිය . වැඩිදුර විස්තර http://gate.iitd.ac.in සහ http://iccr.gov.in යන වෙබ් අඩවිය මගින් ලබා ගත හැක.

කොළඹ

09.09.2019